**බෙන්තොට ප්‍රාදේශීය සභාව**

**ගාල්ල දිස්ත්‍රික්කය**

--------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 27 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 05 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය

------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට බෙන්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කර්මාන්ත 03 ක් සඳහා රු.762,946 ක් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ද කර්මාන්තයක් සඳහා රු.203,959 ක් 2012 වර්ෂය වෙනුවෙන් ද ප්‍රතිපාදන නොසැලසීම නිසා සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වැය රු.762,946 කින් අඩුවෙන් සමුච්චිත අරමුදල රු.203,959 කින් වැඩියෙන් හා පොදු සැපයුම් ණයහිමියෝ රු.966,905 කින් අඩුවෙන් දැක්විණි.

(ආ) දොරින් දොරට - ගමින් ගමට ආර්ථික සංවර්ධන වැඩ සටහන 2014 යටතේ කර්මාන්ත 09 ක් සඳහා පළාත් පාලන කොමසාරිස් විසින් අනුමත කළ මුදල රු.4,746,599 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධන වැය ලෙස රු.5,126,883 ක් දැක්වීමෙන් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වැය හා ණයහිමියෝ රු.380,284 බැගින් වැඩියෙන් දැක්විණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.693,217 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු.734,750 ක් ලෙස දැක්වීමෙන් සමාලෝචිත වර්ෂයේ වරෙන්තු ගාස්තු හා දඩ ආදායම සහ ආදායම් ණයගැතියෝ රු.41,533 බැගින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) නවීකරණය කරන ලද අංක 252-6569 දරන කැබ් රථයේ වටිනාකම ප්‍රාග්ධනිත කිරීමේ දී කැබ් රථයේ මූලික වටිනාකම වූ රු.1,500,000 හා නවීකරණයෙන් පසු වටිනාකම රු.1,800,023 අතර වෙනස වූ රු.300,023 ක් ප්‍රාග්ධනිත කරනු වෙනුවට නවීකරණයෙන් පසු වටිනාකම වූ රු.1,800,023 ක් ප්‍රාග්ධනිත කිරීමෙන් මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය රු.1,500,000 කින් වැඩියෙන් දැක්විණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දී දකුණු පළාත් සභා ප්‍රධාන ලේකම්ගෙන් ලැබී තිබූ **RD** 6882 දරන ට්‍රැක්ටරයේ හා **RX** 1020 දරන ට්‍රේලරයේ වටිනාකම් තක්සේරු කර ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු.110,302 ක පුස්තකාල පොත් ප්‍රාග්ධන ආධාර ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

---------------------------

ගිණුම් විෂයයන් 08 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.2,144,837 ක වෙනසක් පැවතුණි.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු.163,353,459 ක් වූ ගනුදෙනු සම්බන්ධව හිමිකම් ඔප්පු, යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, සමීක්ෂණ මණ්ඩල වාර්තා හා ශේෂ සනාථ සහතික පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.6,445,200 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.5,459,925 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

----------------------

### 2.2.1 වරිපනම් බදු හා අක්කර බදු

----------------------------

2014 දෙසැම්බර් 31 දිනට රු.3,453,938 ක වරිපනම් බදු, රු.129,418 ක අක්කර බදු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීම සඳහා සභා ලේකම්වරයා විසින් කටයුතු කර නොතිබුණි.

### 2.2.2 බදු කුලී

---------

බෙන්තොට, ඇල්පිටිය පාරේ කඩ කාමර එකකින්, පොදු වෙළඳපොල කඩ කාමර 03 කින් හා පැරණි බස් නැවතුම්පල කඩ කාමර එකකින් රු.61,228 ක හිඟ කඩ බදු ආදායමක් 2014 දෙසැම්බර් 31 දිනට පැවතිය ද, සභා ලේකම් විසින් කඩ බදු ගිවිසුම්වල 04 වන කොන්දේසිය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට රු.788,582 ක උසාවි දඩ හා රු.13,625,235 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

### 2.3 අධිභාර

--------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාර වගකිවයුතු පුද්ගලයින්ට එරෙහිව 1983 වර්ෂය තුළ පනවන ලද අධිභාරයක් සම්බන්ධයෙන් 2014 දෙසැම්බර් 31 දිනට රු.6,238 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

1988 අංක 74 දරන (සංශෝධන) පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ අවශ්‍යතාවයන් අනුව 2013 වර්ෂය සඳහා සභාවේ උප සභාපති ඇතුළුව සභිකයින් 11 දෙනෙකු විසින් ද, 2014 වර්ෂය සඳහා සභාවේ සභාපති, උප සභාපති ඇතුළුව සියළුම සභිකයින් විසින් ද වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දී නොතිබුණි.

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

2005 මාර්තු 31 දිනැති අංක : 8/2005 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 11.5 වගන්තිය අනුව දේපල ණය සඳහා බැංකු පොලී අනුපාතය හා නිලධාරීන්ගෙන් අයකරන සියයට 4 ක පොලී අනුපාතය අතර වෙනස රු.234,173 ක් සභා අරමුදලින් ගෙවා ඇතත්, එම මුදල පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කරවාගෙන නොතිබුණි.

### 3.3 නිෂ්ක්‍රීය වත්කම්

------------------

සභාව සතු ට්‍රැක්ටරයක් හා කැබ් රථයක් වර්ෂ 06 කට වඩා වැඩි කාලයක සිට සභාවේ ගරාජය තුල දිරාපත් වෙමින් පැවතුන ද, ඒවා අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

**4.** **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

----------------------------------------

**අයවැය පාලනය**

-------------------

අයවැය ලේඛනයෙහි ඇස්තමේන්තුගත සහ තථ්‍ය වශයෙන් ලැබූ ආදායම් අතර විචලනයන් පවතින බවත්, ඇතැම් වියදම් විෂයයන්වල ඉතිරි කිරීම් තිබූ බවත් නිරීක්ෂණය විය. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන ඇති බවක් නිරීක්ෂණය නොවුණි.

**5.** **පද්ධති හා පාලන**

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය